1

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 5/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1988 පෙබරවාරි මස 11 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

රජයේ සේවකයින්ට සිංහල/දෙමළ/ඉංග්‍රීසි ඉගැන්වීම

ඉහත සඳහන් භාෂා පිළිබඳව ප්‍රවීණතාව ලබාගැනීමට රාජ්‍ය නිලධාරීන් දිරිගැන්වීම සඳහා පහත සඳහන් ක්‍රමය අනුගමනය කිරීමට තීරණය කර ඇත,

(අ) දැනට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හෝ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හෝ පවත්වන දෙමළ භාෂා පාඨමාලාව හදාරා සාර්ථකව අවසන්කර සහතික පත්‍රයක් ලබන සිංහල නිලධාරියෙකුටත්,

(ආ) ඉහත සඳහන් ආයතනයක් පවත්වන සිංහල භාෂා පාඨමාලාව හදාරා සාර්ථකව අවසන් කර ඒ හා සමාන සහතික පත්‍රයක් ලබන සිංහල නොවන නිලධාරියෙකුටත්,

(ඇ) පැමිණීම අවම වශයෙන් 90% ක් සම්පූර්ණ කර තිබීමට හා ඉංග්‍රීසි ප්‍රවීණතාවයක් නොතිබූ අයෙක් බවට එම ආයතන විසින් පාඨමාලාව ආරම්භයේදී නිශ්චය කරනු ලැබීමට යටත්ව, ඉහත සඳහන් ආයතනයක් පවත්වන ඉංග්‍රීසි පාඨමාලාව හදාරා සාර්ථකව අවසන් කර සහතික පත්‍රයක් ලබන ඕනෑම නිලධාරියෙකුටත්,

රු.500/= බැගින් ප්‍රසාද මුදලක් ගෙවිය යුතුය.

02. ඉහත පාඨමාලා හා සෑම අතින්ම සැසඳිය හැකි පාඨමාලා (දැනට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පවත්වන භාෂා පුහුණු පාඨමාලාවලට අමතරව) අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් හෝ සංවිධානය කර පවත්වන්නේ නම්, එම පාඨමාලාව හදාරා සාර්ථකව අවසන් කර සහතික පත්‍රයක් ලබන නිලධාරියෙකුටද ඉහත සඳහන් ප්‍රසාද මුදල ගෙවිය හැකිය.

03. මේ සඳහා අවශ්‍ය මුදල් ඒ ඒ අමාත්‍යාංශ සඳහා වෙන්කළ ප්‍රතිපාදනවලින් දැරිය යුතුය.

Siriwardhana

ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.